# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1814/39 - 2013 ජුනි මස 12 වැනි බදාදා - 2013.06.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකුවේ නිවේදන

**විනිමය පාලන පනත යටතේ දැන්වීම (ලංකා ව්‍යවස්ථාදායක ප්‍රඥප්තීන්ගේ 423 වැනි අධිකාරය)**

අනේවාසිකයන් සතුව පවතින නිශ්චල දේපළ අත්පත් කර ගැනීම සඳහා ගෙවීම් සිදු කිරීමට නේවාසිකයන්ට අවසර ලබාදීම

(1) ශ්‍රී ලංකාවෙන් පිටත වාසික තැනැත්තෙකු විසින් නිශ්චල දේපළ අත්පත් කර ගැනීම, හිමිකම සහ භුක්ති විඳීම සම්බන්ධයෙන් කලින් කලට බලපවත්වන නීතිවලට යටත්ව, ශ්‍රී ලංකාවෙහි ඇති නිශ්චල දේපළක් එම දේපලෙහි ශ්‍රී ලංකාවෙන් පිටත වාසික අයිතිකරු හෝ අයිතිකරුගේ උරුමකරු විසින් විකුණන අවස්ථාවේදී එම විකුණුම් වටිනාකම ශ්‍රී ලංකාවෙන් පිටත වාසික තැනැත්තෙකුට ශ්‍රී ලංකා රුපියල්වලින් ගෙවීම් සිදු කිරීමට ශ්‍රී ලංකාවේ වාසික තැනැත්තෙකුට 7 වන වගන්තියේ (අ) උපවගන්තිය යටතේ මෙයින් අවසර ලබා දෙනු ලැබේ.

(2) මෙම විධානයේ අරමුණ සඳහා,

(අ) 'නිශ්චල දේපළ' යන්නෙහි අදහස ඉඩම් සහ ගොඩනැගිලි වේ ;

(ආ) 'ශ්‍රී ලංකාවේ වාසික තැනැත්තෙකු' සහ 'ශ්‍රී ලංකාවෙන් පිටත වාසික තැනැත්තෙකු' යන්නෙහි අදහස විනිමය පාලන පනතේ 37 වගන්තියේ 1 වැනි උප වගන්තිය යටතේ මුදල් ඇමතිතුමා විසින් නිකුත් කරන ලද 1972.04.21 වැනි දින අංක 15007 දරන *රජයේ ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද විධානය පරිදි වේ.

(3) 2003.10.28 දින අංක 1312/9 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද දැන්වීම මෙයින් පරිච්ජින්න කරනු ලැබේ.

පී. එච්. ඕ. චන්ද්‍රවංශ,
විනිමය පාලක.

2013 ක් වූ ජුනි මස 12 වැනි දින,
කොළඹ දී ය.

06 - 761

1A - G 017794 — 330 (2013/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*